# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2025.10.31** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. රියදුරු (III ශ්‍රේණිය)

**සුදුසුකම්** :

(අ) . අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබීම.

**සහ**

(ආ). බර වාහන පැදවීම සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර රියදුරු බලපත්‍රයක් ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක (03) රිය පැදවීමේ පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : UPL 3 (III) –රු. 48,005 – 16 X 490 ; 55,845 මාසික (2027.01.01 දින සිට)
(2025.04.01 දින සිට ගෙවන වැටුප රු. 61,039.00 + රු. 17,800.00 මාසික)

**බඳවා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 02. ක්‍රීඩාපිටි සේවක (III ශ්‍රේණිය)

**සුදුසුකම්** :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබීම.

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : U PL 1(III) රු. 42,775-16x450 – 49,975 මාසික (2027.01.01 දින සිට)

(2025.04.01 දින සිට ගෙවන වැටුප රු. 55,567.00 + රු. 17,800.00 මාසික)

**බඳවා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 03. පුස්තකාල සේවක (III ශ්‍රේණිය)

**සුදුසුකම් :**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයක් (6) සමත් වී තිබීම.

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** U PL 1(III) රු. 42,775-16x450 – 49,975 මාසික (2027.01.01 දින සිට)

(2025.04.01 දින සිට ගෙවන වැටුප රු. 55,567.00 + රු. 17,800.00 මාසික)

**බඳවා ගැනීම :** ප්‍රායෝගික පරීක්ෂණයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 04. උද්‍යාන සේවක (III ශ්‍රේණිය)

**සුදුසුකම් :**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයක් (6) සමත් වී තිබීම.

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** U PL 1(III) රු. 42,775-16x450 – 49,975 මාසික (2027.01.01 දින සිට)
(2025.04.01 දින සිට ගෙවන වැටුප රු. 55,567.00 + රු. 17,800.00 මාසික)

**බඳවා ගැනීම :** ප්‍රායෝගික පරීක්ෂණයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 05. වැඩ සහායක (III ශ්‍රේණිය)

**සුදුසුකම් :**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබීම.

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** U PL 1(III) රු.. 42,775-16x450 – 49,975 මාසික (2027.01.01 දින සිට)
(2025.04.01 දින සිට ගෙවන වැටුප රු. 55,567.00 + රු. 17,800.00 මාසික)

**බඳවා ගැනීම :** ප්‍රායෝගික පරීක්ෂණයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 06. පශ්චාත් මරණ පරීක්ෂක කම්කරු (III ශ්‍රේණිය)

**සුදුසුකම්** :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටිය යුතුය.

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : U PL 1(III) රු.. 42,775-16x450 – 49,975 මාසික (2027.01.01 දින සිට) (2025.04.01 දින සිට ගෙවන වැටුප රු. 55,567.00 + රු. 17,800.00 මාසික)

**බඳවා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**පොදු සුදුසුකම් :**

සියළුම අයදුම්කරුවන්

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**සටහන :**

- තෝරාගනු ලබන අපේක්ෂකයින්ට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට තම වැටුපෙන් 10%ක් ලෙස දායක විය යුතුය. ඊට අමතරව, විශ්වවිද්‍යාලය විසින් තවත් 15%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ 8%ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට දායක වනු ඇත .තවද, විශ්වවිද්‍යාලය විසින් සේවක භාරකාර අරමුදලට (ETF) 3% ක දායකත්වයක් ලබා දෙනු ඇත.

- ඊට අමතරව, රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ගෙවනු ලබන අතර, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 6/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2/2025(i) හි දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුකූලව වැටුප ගෙවනු ලැබේ.

**අයදුම්පත් ක්‍රියාවලිය**

- අයදුම්පත් **application.ruh.ac.lk.** මගින් මාර්ගගතව ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ සහතික ලිපිගොනු වල සහතික කළ පිටපත් සහිතව සමඟ, 2025.10.31 දින හෝ ඊට පෙර වෙබ් අඩවිය හරහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමු.

## විශේෂ සටහන

- එක් අපේක්ෂකයෙකුට තනතුරු කිහිපයකට අයදුම් කිරීමට අවශ්‍ය නම්, සෑම තනතුරක් සඳහාම වෙන වෙනම අයදුම්පත් මාර්ගගතව ඉදිරිපත් කිරීම කළ යුතුය.
- ඔබ ඉදිරිපත් කරන ලද අයදුම්පත සම්බන්ධයෙන් කිසියම් තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් අවශ්‍ය වූ විට කරුණාකර යොමු අංකය භාවිතා කරන්න.
- **විශ්වවිද්‍යාල පද්ධතියක / රාජ්‍ය දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් පමණක් මාර්ගගත ක්‍රමයට පුරවන ලද අයදුම්පත මාර්ගගතව ඉදිරිපත් කළයුතු අතර එම අයදුම්පත බාගත කරගෙන එය තම ආයතනයේ ප්‍රධානී මගින් නියෝජ්‍ය ලේඛකාධිකාරි,ආයතන අනධ්‍යයන අංශය,රුහුණ විශ්වවිද්‍යාලය,මාතර යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් ඉදිරිපත් කළ යුතුය.**
- ස්ථිර පත්වීම් වන අතර වසර තුනක (03) කාලයක් සඳහා පරිවාස කාලය මත පත්වීම් ලබා දෙනු ලැබේ.
- අපේක්ෂකයින් මූලික සුදුසුකම් පරික්ෂාකිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. මූලික සුදුසුකම් පරික්ෂාකිරීමෙන් පසු තෝරාගත් අපේක්ෂකයින් පමණක් විභාගයට සහ/හෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.
- සෑම අයදුම්පතක් සඳහාම රු 1000.00 ක අයදුම්පත් ගාස්තුවක් අයකරනු ලබයි
- අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලැබෙන ගෙවීම් රිසිට්පත බාගත කර (Download) අදාල ගෙවීම සිදුකර නැවත උඩුගත (Upload) කිරීම අනිවාර්ය වේ.
- ඔබගේ අයදුම්පත සාර්ථකව ඉදිරිපත් කිරීමෙන් පසු ඔබට විද්‍යුත් තැපැල් ලිපිනයට පණිවුඩයක් ලැබෙනු ඇත.
- අසම්පූර්ණ හෝ මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ ඉහත සුදුසුකම් සපුරා නොමැති හෝ නියමිත දිනට පෙර එවීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කවර හේතුවක් නිසා හෝ නැවත සලකා බැලීමට අවකාශ නොමැත.

වැඩ බලන ලේඛකාධිකාරී
රුහුණ විශ්වවිද්‍යාලය
2025.09.26